# විදේශීය පදිංචිකරුවන් සඳහා COVID-19 එන්නත ලබා ගැනීම පිළිබඳ

## COVID-19 එන්නත ලබා ගැනීමට පෙර සහ පසු

| පෙර | පසු |
|---|---|
| △ ඔබ යහපත් සෞඛ්‍ය තත්වයක සිටින විට එන්නත ලබා ගන්න<br><br>△ එන්නත ලබා ගැනීමට පෙර ඔබ වෛද්‍යවරයකු හමුවිය යුතුය.<br><br>△ <u>පහත කරුණු වලින් කවරක් හෝ ඔබට අදාළ නම් ඔබේ එන්නත වෙනත් දිනයක ලබා ගන්න</u><br>-ඔබට COVID-19 රෝගියෙකු නම්<br>-ඔබ දැනට නිරෝධායනයේ සිටින COVID-19 රෝගියෙකු නම් හෝ එවන් COVID-19 රෝගියෙකුගේ ආශ්‍රිතයෙකු නම්.<br>-ඔබට උණ ඇතුළුව උග්‍ර රෝග ලක්ෂණ තිබේ නම් (ශරීර උෂ්ණත්වය 37.5℃ හෝ ඊට වැඩි). | △ ඔබේ එන්නත ලබා ගැනීමෙන් පසු, විනාඩි 15ත් 30ත් අතර කාලයක් සායනයේ රැඳී සිට යම් අහිතකර ප්‍රතික්‍රියා ඇතිදැයි බලන්න. සායනයෙන් පිටව යාමෙන් පසු පැය 3ක් පමණ ඔබගේ සෞඛ්‍ය තත්වය නිරීක්ෂණය කරන්න.<br><br>△ එන්නත ලබා දීමෙන් පසු, සතියක් දැඩි ක්‍රියාකාරකම් වලින් වළකින්න<br><br>△ ඔබේ ශරීරයේ එන්නත විදගත් ස්ථානය පිරිසිදුව තබාගන්න. |

## COVID-19 එන්නත සඳහා ඇතිවිය හැකි අහිතකර ප්‍රතික්‍රියා

△ඔබේ ශරීරයේ එන්නත් කරන ස්ථානයේ වේදනාව, ඉදිමීම හෝ රතු පැහැය ඔබට දැනිය හැකිය. ඔබට තෙහෙට්ටුව, හිසරදය, මාංශ පේශි වේදනාව, සීතල හෝ ඔක්කාරය ඇති විය හැක.

△හුස්ම ගැනීමේ අපහසුව සහ මුහුණේ, ඇස්, තොල් හෝ මුඛයේ ඉදිමීම වැනි රෝග ලක්ෂණ සමඟ ඔබට දැඩි අසාත්මිකතා ප්‍රතික්‍රියාවක් ඇති විය හැකිය.

△පපුවේ වේදනාව, තද බව හෝ අපහසුතාවයක් ඔබට දැනෙන්නට පුළුවන. හුස්ම ගැනීමේදී ඔබට හුස්ම ගැනීමේ අපහසුවක් හෝ වේදනාවක් ඇති විය හැක.

△ඔබට හුස්ම ගැනීමේ අපහසුවක් හෝ වේගයෙන් හෘද ස්පන්දනය වීමක් දැනෙන්නට පුළුවන. ඔබට කරකැවිල්ල හෝ සිහිය නැති විය හැකිය.

## COVID-19 එන්නත සඳහා අහිතකර ප්‍රතික්‍රියාවක් ඇති වුවහොත් කළ යුතු දෑ

△ඔබේ ශරීරයේ එන්නත් කරන ස්ථානයේ ඉදිමීමක් හෝ වේදනාවක් ඇත්නම් පිරිසිදු හා වියලි තුවායක් එම ස්ථානය මත තබා අයිස් වලින් සම්බාහනය කරන්න.

△ඔබට මද උණක් තිබේ නම් හැකි තරම් ජලය පානය කර විවේක ගන්න.

△උණ හෝ මාංශ පේශි වේදනාවට ප්‍රතිකාර කිරීම සඳහා පැරසිටමෝල් ලබා ගන්න .

△ <u>පහත සඳහන් ගැටළු වලින් එකක් හෝ ඔබට ඇතිනම් කරුණාකර වෛද්‍යවරයකු හමුවන්න.</u>

- පපුවේ වේදනාව, තද ගතිය හෝ අපහසුතාවය, හුස්ම ගැනීමේ අපහසුව, හුස්ම හිරවීම හෝ හුස්ම ගැනීමේදී වේදනාව, වේගයෙන් හෘද ස්පන්දනය වීම, කරකැවිල්ල හෝ සිහිය නැති වීම ආදීය නැවත නැවත ඇතිවීම හෝ නරක අතට හැරීම සිදුවේ නම්
- ඔබේ ශරීරයේ එන්නත් කරන ස්ථානයේ යම් වේදනාවක්, ඉදිමීමක් හෝ රතු පැහැය හෝ දින දෙකකට පසු පහව නොයන උණ තිබේ නම්
- කලින් අත්විද නැති හදිසි ශක්තිය නැති වීම හෝ කලින් නොතිබූ රෝග ලක්ෂණ ඇත්නම්

△ඔබට දැඩි හුස්ම ගැනීමේ අපහසුවක්, ඔක්කාරය, මුහුණේ ඉදිමීම හෝ වේදනාව ඇති වුවහොත් 119 අංකය අමතන්න හෝ ළඟම ඇති හදිසි ප්‍රතිකාර අංශය වෙත යන්න.

ඔබට අහිතකර ප්‍රතික්‍රියා ඇත්නම් 1339 අංකයට හෝ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානයක් අමතන්න. අහිතකර ප්‍රතික්‍රියා සහ ඒවා කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩිදුර තොරතුරු ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන වෙබ් අඩවියෙන් (https://ncv.kdca.go.kr) "එන්නත් කිරීමෙන් පසු සෞඛ්‍ය පරීක්ෂාව" ("Post-vaccination Health Check") යන වෙබ් පිටුවට පිවිසීමෙන් ඔබට දැන ගත හැක